**තිරසර සංවර්ධන සභාව - 2021**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

තිරසර සංවර්ධන සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය හා 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01- 2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 05 ඡේදය | සමාලෝචිත වර්ෂය තුළ දී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී තිරසර සංවර්ධන සභාව වෙනුවෙන් සභාපතිවරයෙකු පත් කිරීම සිදුකර නොතිබීම මෙන්ම කොරෝනා වසංගත තත්වය යටතේ ආයතන වසා තිබූ හෝ චක්‍රීය වැඩ මුර යටතේ සේවකයින් රාජකාරීන් සඳහා කැඳවීම හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපනය කිරීම මෙම වකවානුවේදී සිදුවී නොමැත. ඉදිරි කටයුතු සඳහා සටහන් කර ගන්නා ලදී. | නීති රීති විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක PEC 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | තිරසර සංවර්ධන සභාවේ සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එම මූල්‍ය ප්‍රකාශන වර්ෂ 01 ක ප්‍රමාදයකින් පසුව 2023 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේදී තිරසර සංවර්ධන සභාව සඳහා සභාපතිවරයකු පත් කර නොතිබූ අතර ඊට පසු වර්ෂයේ ද වසරින් අඩකට වඩා වැඩි කාලයක් ගතවන තුරු සභාපතිවරයකු පත් කරනු නොලැබුණි. සටහන් කර ගෙන ඉදිරියේ දී ක්‍රියාකිරීම සඳහා ගණකාධිකාරි වෙත උපදෙස් ලබාදෙන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නියමිත දින මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,074,662 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 164,414 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,910,248 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාරයෙන් ලැබීම් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ 10 (ආ) වගන්තිය ප්‍රකාරව අදාළ සියළු පාර්ශවයන් හා පළාත් සභා නවය විමසා සහ ඒවායේ එකඟත්වය ඇතිව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය සකස් කර අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2019 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන මෙම සභාව වාර්තාවේ දිනය වන විට වසර 2 කට අධික කාලයක් ගත වී තිබුණද පනතේ සඳහන් මූලික කාර්යයන් ඉටු කර නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබද ජාතික මෙහෙයුම් කමිටුවක් )National Steering Committee on SDGs) අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පත් කිරීමට ක්‍රියා කර තිබෙන අතර තිරසර ඉලක්ක දහ හත 169 සහ ඊට ආදාල අරමුණු (17) මූලික , ක් කරා ලගා වීමට අවශ්‍ය ඒ .ඇත කාර්යයන් මේ වන විට ඉටුකර ඒ විෂයය පථයන්ට අදාල වන ආයතනප්‍රවාහගත කිරීමට )Mainstreaming) ද ක්‍රියා කරන ලදී . මිට අමතරව එක් එක් විෂයට අදාල තිපත්තියට අනුකූල වන පරිදි ජාතික ප්‍ර තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලත් සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය තිරසර සංවර්ධන සභාව මගින් ඉටු හෝ තාවයන්කරන ලද අතර අවශ්‍ය ලැබෙන ඉල්ලීම් අනුව තව දුරටත්එම කාර්යයන් ඉටුකරමින් පවතීයි. ඒ අනුව විෂයය ක්ෂේත්‍රවලින් ගොඩනැගෙන ජාතික ප්‍රතිපත්තීන් සමස්ථ ජාතික ප්‍රතිපත්තිය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලත්වීම කෙරෙහි පාදක වනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය සකස් කර අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රගති වාර්තා අනුව Develop a Course Module for public service Delivery Strategy වෙනුවෙන් රු.800,000 ක් වෙන්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රගතියක් නිරීක්ෂණය නොවුවද සියයට 40 ක භෞතික ප්‍රගතියක් දක්වා තිබුණි. එවැනි මොඩියුලයක් සංවර්ධනය කර නොමැති බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | 2019 වසර අවසන් වන විට සියලුම අමාත්‍යංශ වල නිලධාරින් සඳහා වැඩමුළු පවත්වා මූලික පුහුණුව ලබාදීමට කටයුතු කර ඇත. එමෙන්ම මූලික විෂයයන් 17ට අදාල වන ආයතන අරමුණු 169 ඔස්සේ ප්‍රවාහගත කිරීමේ කාර්යයයේදී ඒ ඒ විෂයානුබද්ධව කටයුතු කිරීමෙන් ප්‍රතිඵලදායක වන බව පෙනී ගොස් තිබේ.<br>ඒ අනුව වරින් වර ඇති වන අවශ්‍යතා / ඉල්ලීම් සලකා බලමින් මෙම සමාලෝචිත වසර තුල රාජ්‍ය මුදල් වැය නොදරමින් තිරසර සංවර්ධනය උදෙසා රාජ්‍ය සේවය යෙදවීම් වලට අදාලව මාර්ගෝපදේශයන් සැපයීම තිරසර සංවර්ධන සභාව මගින් සිදු කර ඇත. | ආයතනයේ අරමුණු ඉටුකරගැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | ක්‍රියාකාරි සැලැස්මේ දැක්වෙන පරිදි "මානව සම්පත් කළමණාකරණ පද්ධතිය පිහිටුවීම" වෙනුවෙන් රු.500,000 ක් වෙන්කර තිබුණු අතර ඊට අදාල ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු. 82,960 ක වියදමක් දරා තිබුණ ද කුඩා කාර්යය මණ්ඩලයක් සඳහා විශාල පිරිවැයක් යොදාගනිමින් පද්ධතියක් ස්ථාපිත කිරීම සඵලදායි නොවන බව සභාව දක්වා ඇති බැවින් දරා ඇති වියදම නිශ්කාර්ය වී තිබුණි | මානව සම්පත් කළමනාකරණ පද්ධතියකට අන්තර්ගත විය යුතු මානව සම්පත් බඳවාගැනීමේ පුවත් පත් දැන්වීම් පල කිරීමේ ගාස්තු සහ සම්මුඛ පරීක්ෂණ ආශ්‍රිත අනෙකුත් වියදම් මීන් නිරූපණය කර ඇත. මෙම වකවානුව තුල මානව සම්පත අඛණ්ඩව ආයතනය තුල රැඳී නොසිට තිබෙන අතර නව අවස්ථා ලැබීම් / පෞද්ගලික අවශ්‍යතා හේතුවෙන් ආයතනයෙන් ඉවත්ව යෑම් බහුලව සිදු වී ඇත.<br>එමෙන්ම ඉතා කුඩා කාර්යය මණ්ඩලයක් සඳහා විශාල පිරිවැයක් යොදා ගනිමින් පද්ධතියක් ස්ථාපිත කිරීම සඵලදායි නොවන හෙයින් කාලීනව භාවිතා කරනු ලබන සරල මෘදුකාංග යොදා ගනිමින් වඩාත් ඵලදායි ලෙස මානව සම්පත් කළමනාකරණයට අදාල කාර්යයන් ඉටුකර ගැනීම සිදු කරගෙන යනු ලැබේ. | අවශ්‍යතාවය හඳුනාගෙන වියදම් දැරීමෙන් නිශ්කාර්ය වියදම් වලක්වා ගත යුතු බව. |